# අනුරාධපුර යුගයේ පාලනය කෙරෙහි රෝහණ රාජ්‍යයෙන් ඇති වූ බලපෑම

එස්. පී. ඒ මධුෂානි
විශේෂවේදී තෙවන වසර.
ඉතිහාස අධ්‍යයන අංශය.
කැලණිය විශ්වවිද්‍යාලය
alokamadushani47@gmail.com

**සංක්ෂේපය**

අතීත ලංකාව රුහුණු, මායා හා පිහිටි යනුවෙන් පාලන ප්‍රදේශ තුනකට බෙදා තිබූ අතර රුහුණු රාජ්‍යය රජරටින් වෙන් වූයේ මහවැලි ගංගාවෙනි. ලංකාවේ දකුණු ප්‍රදේශය හැඳින්වීමට රෝහණ යන නාමය භාවිතා විය. අතීත ලංකාවේ පාලන කටයුතුවලදී රෝහණය වැදගත් පාලන ප්‍රදේශයක් විය. රෝහණ රාජ්‍ය තුල බලය ව්‍යාප්ත කර ගත් පාලකයන් සහ ඔවුන්ගේ පරම්පරාවන් පිළිබඳව මෙන්ම විශේෂයෙන් අනුරාධපුර රාජ්‍ය සම්බන්ධයෙන් රෝහණය සැලකිය යුතු ප්‍රදේශයක් වන්නේ කෙසේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම මෙයින් අරමුණු කෙරේ. මෙහිදී ක්‍රමවේදය වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය සහ ද්විතියික මූලාශ්‍රයන්ද ශිලා ලේඛන ඇතුළු පුරාවිද්‍යා මූලාශ්‍රයන් ඇසුරින් තොරතුරු එක් රැස් කිරීම සිදු කෙරිණි.

අනුරාධපුර රාජ්‍ය බොහෝ අවස්ථාවලදී රෝහණ රාජ්‍ය දක්වා විහිදින. උතුරේ දක්ෂවූත් බලවත්වූත් පාලකයන් බොහෝ විට උත්සහ කළේ දකුණේ වූ රාජ්‍ය තමන් යටතට ගැනීමටයි. රෝහණ රාජ්‍ය තුළින් ද බොහෝ බලවත් පාලකයන් බලයට පත් වූ අතර ඇතැමුන් අනුරාධපුර රාජධානිය දක්වා බලය ව්‍යාප්ත කිරීමට සමත් විය. අනුරාධපුරයට දුරින් පිහිටීම ප්‍රයෝජනයට ගනිමින් බොහෝ අවස්ථාවල අනුරාධපුරයට එරෙහිව කැරලි ගැසීය. එසේම විදේශ ආක්‍රමණ සහ අභ්‍යන්තර කුමන්ත්‍රණ පැනනැඟි අවස්ථාවලදී අනුරාධපුරයේ රජවරුන්ට රෝහණය අභයස්ථානයක්ද විය. මේ ආකාරයට අනුරාධපුර රාජධානිය සම්බන්ධයෙන් රෝහණය සැලකිය යුතු බලපෑමක් කළ ප්‍රදේශයක් විය. අනුරාධපුර රාජධානිය වසර දහසකට අධික කාලයක් පැවතීමටත් සිංහල රාජත්වය සහ බෞද්ධ ආගම ආරක්ෂා වීමටත් රෝහණ රාජ්‍ය තුළින් විශාල දායකත්වයක් හිමි විය. එබැවින් සෑම රජ කෙනෙකුගේම අභිප්‍රාය වූයේ මේ ප්‍රදේශය තමා නතු කොට තබා ගැනීම වන බව අධ්‍යයනයේදී පැහැදිලි විය.

**ප්‍රමුඛ පද :- අනුරාධපුරය, රෝහණ රාජ්‍ය, ආක්‍රමණ, පාලන කටයුතු**